ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

මහනුවර ධර්මරාජ විද්‍යාලයීය ආදිශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ)

මහනුවර ධර්මරාජ විද්‍යාලයීය ආදිශිෂ්‍ය සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා විසින් 2013 මැයි මස 22 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 මැයි මස 13 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

[241 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

2—PL 007279—750 (2013/05)

මහනුවර ධර්මරාජ විද්‍යාලයීය ආදිශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ)

මහනුවර ධර්මරාජ විද්‍යාලයීය ආදිශිෂ්‍ය සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"මහනුවර ධර්මරාජ විද්‍යාලයීය ආදිශිෂ්‍ය සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් අංක 35, අනගාරික ධර්මපාල මාවත, මහනුවර යන ලිපිනයෙහි පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2013 අංක දරන මහනුවර ධර්මරාජ විද්‍යාලයීය ආදිශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මහනුවර ධර්මරාජ විද්‍යාලයීය ආදිශිෂ්‍ය සංගමය සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) මහනුවර ධර්මරාජ විද්‍යාලයීය ආදිශිෂ්‍ය සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මහනුවර ධර්මරාජ විද්‍යාලයීය ආදිශිෂ්‍ය සංගමය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

2—PL 07134—75 (2013/03)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) බෞද්ධයන් සඳහා අධ්‍යාපනික, සංස්කෘතික, සමාජයීය, සෞඛ්‍යය සහ ආධ්‍යාත්මික දියුණුව සඳහා වූ මහනුවර ධර්මරාජ විද්‍යාලයේ ක්‍රියාකාරිත්වයට සහයෝගයක් ලබාදීම;

(ආ) ස්වකීය දියුණුව සඳහා මිනිසුන්ගේ දක්ෂතා සහ ස්වේච්ඡාත්මක උත්සාහයන් ප්‍රයෝජනයට ගැනීමට සැලැස්වීම;

(ඇ) සංගමයේ සංවර්ධන වැඩපිළිවෙලවල් සඳහා අවශ්‍ය සම්පත් ලබාගැනීමට සහ එවැනි ව්‍යාපෘති වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම;

(ඈ) අධ්‍යයන කව, සම්මන්ත්‍රණ, වැඩමුළු, දේශන, සාකච්ඡා, වාද, දහම් පාසල් සහ පෝය දින වැඩසටහන් පැවැත්වීම;

(ඉ) බුද්ධාගම සහ බෞද්ධ සංස්කෘතිය හැදෑරීම සඳහා ආධාර මුදල්, ශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර සහ ත්‍යාග ප්‍රදානය කිරීම;

(ඊ) මුදලින් හෝ ද්‍රව්‍යවලින් ත්‍යාග, ආධාර මුදල්, පරිත්‍යාග, සහනාධාර සහ සම්මාදම් දීම, භාරගැනීම සහ එකතු කිරීම;

(උ) යම් ආධාරයක් හෝ උපකාරයක් අවශ්‍ය ශිෂ්‍යයන්ට ආධාර සහ උපකාර කිරීම;

(ඌ) පුස්තකාල, කියවීම් ශාලා සහ අභ්‍යාස මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම;

(එ) පොත්පත්, වාර ප්‍රකාශන සහ සඟරා රැස්කිරීම, මුද්‍රණය කිරීම, ප්‍රසිද්ධ කිරීම සහ බෙදාහැරීම;

(ඒ) සංගමයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් සංවිධාන සමග සුහද සබඳතාවක් ඇති කර ගැනීම;

(ඔ) භාරකරුවන් වශයෙන් කටයුතු කිරීම සහ භෞතික සම්පත් කළමනාකරණය;

(ඕ) මහනුවර ධර්මරාජ විද්‍යාලය සංවර්ධනය කිරීම; සහ

(ක) ඉහත සඳහන් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ නිර්මාණයන් ඉදිකිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට ගැනීමේ, සේවයෙහි නියුක්ත කිරීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වූ හෝ සියලු ක්‍රියා, කාරණා සහ දේ ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු, මේ පනතේ විධිවිධානවලට සහ 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව ගරු සභාපති, ගරු ලේකම්, ගරු භාණ්ඩාගාරික සහ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන වෙනත් විසි පස් දෙනකුට නොඅඩු කමිටු සාමාජිකයින් ගණනකින් සමන්විත වූ කළමනාකරණ මණ්ඩලයක් විසින් සංගමයේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංගමයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය. පූර්ව කළමනාකරණ මණ්ඩලයේ පුරප්පාඩු සෙසු සාමාජිකයින්ගේ අනුමතිය මත පත්කළ යුතු ය. ප්‍රධාන විධායක නිලයන් පත් කළ යුත්තේ එම මණ්ඩලයේ සාමාජිකයින්ගෙනි.

සංස්ථාවේ රීති.

6. (1) පහත දැක්වෙන් සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් ඉවත් කිරීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම;

(ආ) සංගමයේ නිලධරයන් තෝරා පත්කර ගැනීම, සභාවේ නිලධරයන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම හෝ ධුර අත් හැරීම සහ සංගමයේ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කිරීම සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍යය මෙන්ම ධුර කාලය;

(ඈ) සංස්ථාවේ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ බලතල, විනය පාලනය, කාර්යය සහ කර්තව්‍ය;

(ඉ) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී හෝ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය, එම රැස්වීම්වල වේලාවන්, ස්ථාන, දැන්වීම් සහ න්‍යාය පත්‍රය, එහි ගණපූර්ණය සහ එම රැස්වීම්වල කටයුතු පැවැත්වීම;

(ඊ) සංස්ථාවේ දේපල පරිපාලනය සහ කළමනාකරණය, එහි අරමුදල් භාරයේ තබා ගැනීම සහ ස්වකීය ගිණුම් පවත්වාගෙන යාම සහ විගණය කිරීම; සහ

(උ) සාමාන්‍යයෙන්, සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදන ලද ආකාරයට ම එවැනි ම රැස්වීමක දී කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සාදන ලද රීතිවලට සෑම විටම සංස්ථාවේ සාමාජිකයන් යටත් විය යුතු ය.

(4) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මක වූ සංගමයේ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට, මේ වගන්තිය යටතේ සෑදූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

7. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග, රික්ථවරණ, පරිත්‍යාග, පැවරුම්, ග්‍රාහක මුදල්, දායක මුදල් හෝ ගාස්තු කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනාවක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ මුදල් සහ දේපල කවර ස්ථානයකින් උපලබ්ධි වුව ද, මෙහි දක්වා ඇති පරිදි, සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක්ම යොදවනු ලැබිය යුතු අතර, ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාභයක් වශයෙන් සංස්ථාවේ මුදල් සහ දේපලවලින් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

(4) සංස්ථාවේ දේපල පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ වැඩි දියුණු කිරීම යම් අගය ක්ෂය වීමේ අරමුදලක් හෝ නිදන්ගත අරමුදලක් සංස්ථාව විසින් පිහිටුවනු ලැබිය හැක.

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. සංස්ථාවේ විගණනය හා ගිණුම්.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම. වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, සභාව තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාවේ විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක් යන්නෙන්

අදහස් වේ.

9. සභාපති සහ ලේකම්වරයා හෝ භාණ්ඩාගාරික යන දෙදෙනාගෙන් කෙනෙකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව තැබිය යුත්තේ කෙසේ ද යන බව.

10. සංස්ථාවේ කිසිම සාමාජිකයකු ඔහුගෙන් සංස්ථාවට අය විය යුතු වාර්ෂික දායක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ගෙවීමට යටත් නොවිය යුතු ය. සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

11. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව වූ දිනයෙහි සංගමයෙහි පැවැති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංගමය විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට ගෙවිය යුතු ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය. සංගමය විසින් සහ සංගමයට ගෙවිය යුතු මුදල්.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපල දැරිය හැකි බව.

12. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමැති පත්‍රයකින් දේපල බැහැර කිරීමක්, ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපලක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපල සංස්ථාවේ තත්කාලීනව බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ කාර්යය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපල.

13. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමතයකට පත් කිරීමේ පසු කවර හෝ යම් දේපලක් ඉතිරි වුවහොත් ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර, බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර, සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

14. මේ පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන්නන් හැර ශ්‍රී ලංකා ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

සද්භාවයෙන් කරන ලද ක්‍රියා සඳහා වගකීමෙන් නිදහස් වීම.

15. මේ පනතින් හෝ ඒ යටතේ පවරනු ලැබූ බලතල ප්‍රකාර නැතහොත් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරනු ලැබ හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් නඩු පවරනු ලැබීමට හෝ වෙනත් නීති කෘත්‍යයකට ඒ තැනැත්තා යටත් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

16. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුව හොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

 මහනුවර ධර්මරාජ විද්‍යාලයීය ආදිශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ)

අංක 5 (2) ප්‍රකාර කළමනාකරණ මණ්ඩලය

සභාපති - කේ එම්. ආර්. කුලතුංග මහතා
ලේකම් - ප්‍රියන්ත අබේකෝන් මහතා
භාණ්ඩාගාරික - තිස්ස ජයසිංහ මහතා

1. සෙනරත් ජයසුන්දර මහතා
2. සරත් ප්‍රනාන්දු මහතා
3. එන්. ඩබ්. වීරකෝන් මහතා
4. අජිත් නාරම්පනාව මහතා
5. ආතර් සිල්වා මහතා
6. ආනන්ද ජයසුන්දර මහතා
7. සීවලී අබේසේකර මහතා
8. වෝල්ටර් රණසිංහ මහතා
9. සාදර තෙන්නකෝන් මහතා
10. ජගත් සමරසිංහ මහතා
11. මහින්ද සෙනවිරත්න මහතා
12. සංජය එදිරිසූරිය මහතා
13. සී. එස්. ඒකනායක මහතා
14. කේ. බී. සමරකෝන් මහතා
15. ඒ. බී. සමරකෝන් මහතා
16. මහින්ද පෙතියාගොඩ මහතා
17. උදය යටවර මහතා
18. එස්. බී. හේරත් මහතා
19. සරත් මුණවීර මහතා
20. යසස් චන්ද්‍රසේකර මහතා
21. ප්‍රසාද් විතානගේ මහතා
22. සමන් රත්නායක මහතා

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.